සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved.



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# ආර්ථික විද්‍යාව - I

**12 ශ්‍රේණිය** | **කාලය පැය 02 යි.**

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

---

(01) නිෂ්පාදන සම්පත්වල "අජීවි සම්පත්" ලෙස සලකනු ලබන්නේ,

(1) නිෂ්පාදන ක්‍රියාවලියේදී ස්වභාව ධර්මයා විසින් නැවත ප්‍රතිජනනය නොකරන සම්පත්ය.

(2) නිෂ්පාදන ක්‍රියාවලියේදී කෘත්‍රිම ලෙස සකස් කරන ලද සම්පත්ය.

(3) භූමිය හා එහි අන්තර්ගත සියළුම සම්පත්ය.

(4) භූමිය හා ආර්ථික සම්පත් ය.

(5) නිෂ්පාදන ක්‍රියාවලියේදී භාවිතයත් සමඟ නැවත ස්වභාව ධර්මයා විසින් ප්‍රතිජනනය කරන සම්පත්ය. (........)

(02) 'නොමිල භාණ්ඩයක' ලක්ෂණයක් ප්‍රකාශ වන්නේ මින් කවර ප්‍රකාශය මගින්ද?

(1) පාසල් සිසුන්ට නොමිලේ ලබාදෙන නිල ඇඳුම්

(2) සහනදායි මිලකට ජනතාවට ලබාදෙන විදුලිබලය

(3) භාණ්ඩයක් නිෂ්පාදනයේදී "විකල්ප ප්‍රයෝජන සහිත" සම්පත් භාවිතා කරමින් නිපදවන භාණ්ඩ

(4) භාණ්ඩයක් නිෂ්පාදනයේදී ආවස්ථික පිරිවැයකින් නිපදවන භාණ්ඩ

(5) භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමේදී ආවස්ථික පිරිවැය ශූන්‍ය වන භාණ්ඩ (........)

(03) ඕනෑම ආර්ථික සමාජ පද්ධතියකට මුහුණ පෑමට සිදුවන 'පොදු ආර්ථික ප්‍රශ්නය' වන්නේ,

(1) ස්වභාවික සම්පත් හායනය පිළිබඳ ඇති ගැටළුව

(2) ස්වභාවික සම්පත් අධි උපයෝජනය පිළිබඳ ඇති ගැටළුව

(3) ජාත්‍යන්තර ත්‍රස්තවාදය ව්‍යාප්තවීමේ ගැටළුව

(4) මිනිස් වුවමනා සපුරාලීමට අවශ්‍යය සම්පත් සීමාසහිත වීමේ ගැටළුව

(5) මිනිස් වුවමනා සපුරාලීමට ඇති සම්පත් භාවිතයට අවශ්‍යය තාක්ෂණය ප්‍රමාණවත් නොවීම පිළිබඳ ගැටළුව (........)

(04) පරිභෝජන භාණ්ඩ හා ප්‍රාග්ධන භාණ්ඩ නිෂ්පාදනය කරන ආර්ථිකයක පරිභෝජන භාණ්ඩ වැඩිකිරීමට තීරණය කරන ලදී. 'පරිභෝජන භාණ්ඩ වැඩිකිරීම සම්බන්ධව ආවස්ථික පිරිවැය වනුයේ,

(1) පරිභෝජන භාණ්ඩ නිෂ්පාදනය වැඩිවීම. (2) ප්‍රාග්ධන භාණ්ඩ නිෂ්පාදනය පහළ වැටීම.

(3) ප්‍රාග්ධන භාණ්ඩ නිෂ්පාදනය වැඩි වීම. (4) පරිභෝජන භාණ්ඩ නිෂ්පාදනය පහළ වැටීම.

(5) සමස්ථ ඉතිරිකිරීම් පහළ වැටීම. (........)

(05) ආර්ථිකයකට තම නිෂ්පාදන හැකියා මායිමේ උපරිම නිෂ්පාදන මට්ටම ඉක්මවූ භාණ්ඩ සංයෝගයක් පරිභෝජනයට අවස්ථාව ලැබිය හැක්කේ,

(1) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය වමට විතැන්වීමක් වූ විටය.

(2) වඩා කාර්යක්ෂම නිෂ්පාදනයක් මගින් ජාත්‍යන්තර වෙළඳාමට පිවිසීමෙන්ය.

(3) රට රටවල් අතර ද්විපාර්ශවීය වෙළඳ ගිවිසුම් ක්‍රියාත්මක කිරීමෙන්ය.

(4) තම රටට අවශ්‍යය භාණ්ඩ වලින් එක් නිෂ්පාදනයක් වැඩිකිරීමෙන්ය.

(5) ශ්‍රමයේ ඵලදායිතාවය වැඩි කිරීම මගින්ය. (........)

(06) 'ආර්ථික පද්ධතියක්' යනුවෙන් ප්‍රකාශ වන්නේ,
(1) සාර්ව ආර්ථික අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කරන සමාජයකි.
(2) මූලික ආර්ථික ප්‍රශ්න විසඳාගැනීමට ක්‍රියාත්මක වන විධාන ආර්ථිකයකි.
(3) මූලික ආර්ථික ප්‍රශ්න විසඳාගැනීමට ක්‍රියාත්මක වන පෙළඳපල ආර්ථිකයකි.
(4) මූලික ආර්ථික ප්‍රශ්න විසඳා ගැනීම සඳහා මිනිසා විසින් තෝරා පත්කරගන්නා ලද සමාජ වැඩපිළිවෙලකි.
(5) සාර්ව ආර්ථික අරමුණු අත්පත්කර ගැනීමට ක්‍රියාකරන ජාත්‍යන්තර වැඩ පිළිවෙලකි. (........)

(07) ආර්ථික භාණ්ඩයක් ලෙස හඳුන්වන්නේ,
(1) හිඟ සම්පත් භාවිතාකර නිෂ්පාදනය කරන ලද භාණ්ඩ වේ.
(2) අසීමිත සැපයුමක් ඇති සම්පත් භාවිතා කර නිපදවන භාණ්ඩ වේ.
(3) නිෂ්පාදනයේදී ආවස්ථික පිරිවැය ශුන්‍ය වූ භාණ්ඩ වේ.
(4) රජය විසින් නිෂ්පාදනය කරන ලද භාණ්ඩ වේ.
(5) ප්‍රතිස්ථාපනය කළ හැකි සම්පත් භාවිතා කර නිපදවන භාණ්ඩ වේ. (........)

(08) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් දකුණට විතැන්වීම සඳහා හේතුවිය හැක්කේ මින් කවර සාධකයද?
(1) පූර්ණ සේවා නියුක්ති මට්ටමේ දීය.
(2) පූර්ණ සේවා වියුක්තියක් වූ විටදීය.
(3) පවත්නා සම්පත් විනාශ වීමකදීය.
(4) නව තාක්ෂණික ශිල්පීය ක්‍රම භාවිතයේදී ය.
(5) ආර්ථිකයේ ජනගහණයෙන් වැඩි කොටසක් භාණ්ඩයට කරන ඉල්ලුම වැඩි කළ විටදීය. (........)

(09) ආර්ථිකයක 'මානව ප්‍රාග්ධනය' වැඩි දියුණු වූ විට එම,
(1) ආර්ථිකයේ නිෂ්පාදන හැකියාව වමට විතැන් වේ.
(2) ආර්ථිකයේ නිෂ්පාදන හැකියාව දකුණට විතැන් වේ.
(3) ආර්ථිකයේ නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය මත කටයුතු කරයි.
(4) ආර්ථිකයේ නිෂ්පාදන හැකියාව මත පිහිටි ලක්ෂයක් ඇතුළතට ගමන් කරයි.
(5) ආර්ථිකයේ නිෂ්පාදන හැකියා වක්‍රය මත පිහිටි ලක්ෂ්‍යක් වක්‍රය මගින් ඉහළට ගමන් කරයි. (........)

(10) මධ්‍යගත සැළසුම් ආර්ථික පද්ධතියක් යන්න පැහැදිලිව හඳුනාගත හැකි ප්‍රධාන ලක්‍ෂණයක් වන්නේ,
(1) සියළුම දේපළ හා සම්පත් පෞද්ගලික හිමිකාරත්වයට හිමි වීම.
(2) දේපළ හා සම්පත් පොදු හිමිකාරීත්වයට හිමිවීම.
(3) දේපළ හා සම්පත් පෞද්ගලික හා පොදු හිමිකාරීත්වයට හිමිවීම.
(4) මිල යන්ත්‍රණය මගින් මූලික ආර්ථික ප්‍රශ්න විසඳීම.
(5) ස්වර්ථය පදනම් කරගෙන භාණ්ඩ හා සේවා නිෂ්පාදනය (........)

(11) නිදහස් ව්‍යවසාය ආර්ථික ක්‍රමයක 'මිල යන්ත්‍රණයේ කාර්යයක් වන්නේ,
(1) අභ්‍යන්තර මිල ස්ථායිතාවය ආරක්‍ෂා කිරීම.
(2) බාහිර මිල ස්ථායිතාවය ආරක්‍ෂා කිරීම.
(3) හිඟ සම්පත් සලාකනය කිරීම.
(4) නිෂ්පාදනයේ කාර්යක්‍ෂමතාවය ආරක්‍ෂා කිරීම.
(5) පොදු භාණ්ඩ සඳහා සම්පත් බෙදා වෙන්කිරීම. (........)

(12) ඕනෑම ආර්ථිකයකට මූලික තේරීම් ප්‍රශ්නවලට මුහුණ දීමට සිදුවන්නේ,
(1) සම්පත්වල විකල්ප භාවිතා ඇති බැවිනි.
(2) සම්පත්වල හිඟකම හා ඒවායේ විකල්ප භාවිත ඇති බැවිනි.
(3) සම්පත්වලින් භාණ්ඩ නිපදවීමට ඇති තාක්‍ෂණික ශිල්ප ක්‍රමවල දුර්වලතා ඇති බැවිනි.
(4) සමහර භාණ්ඩ නිෂ්පාදනයට සම්පත් නොගැලපීම නිසාවෙනි.
(5) සම්පත්වල ආවස්ථික පිරිවැයක් හට ගන්නා බැවිනි. (........)

(13) සම්පත් බෙදාහැරීමේ කාර්යක්ෂමතාවය යනුවෙන් අදහස් වන්නේ,

(1) පූර්ණ නිෂ්පාදනයක් ලබාගත හැකි පරිදි සම්පත් උපයෝජනය කර ගැනීමයි.

(2) පූර්ණ සේවා නියුක්තියක් ආර්ථිකයේ ඇතිවන පරිදි නිෂ්පාදන සම්පත් භාවිත කිරීමයි.

(3) පූර්ණ නිෂ්පාදනයත්, පූර්ණ සේවා නියුක්තියත් එකවර අන්තර්ගත වන පරිදි සම්පත් යෙදවීමයි.

(4) හැම විටම පොදු භාණ්ඩ නිෂ්පාදනයට සම්පත් බෙදා වෙන්කිරීමයි.

(5) සමාජයට වඩාත් අවශ්‍යකරන භාණ්ඩ හා සේවා නිෂ්පාදනය සඳහා සම්පත් බෙදා වෙන්කිරීමයි. (........)

(14) වෙළඳපල ආර්ථිකයක 'ලාභය' මගින් සිදුවන වැදගත් කාර්යයක් වන්නේ,

(1) ශුභ සාධන භාණ්ඩ නිෂ්පාදනයට මග පෙන්වීම.

(2) වෙළඳපොළට සංඥා සැපයීමට මග පෙන්වීම.

(3) ආර්ථිකයේ කාර්යක්ෂමතාවයට මග පෙන්වීම.

(4) ආර්ථිකයේ පෞද්ගලික දේපොල ආරක්ෂා කිරීම.

(5) ඉහත සඳහන් කාර්යයන් සියල්ලටම මග පෙන්වීම. (........)

(15) ආර්ථිකයක ආර්ථිකයේ කාර්යක්ෂමතාව අත්පත් කර ගැනීමට නම්,

(1) අවම යෙදවුම් ප්‍රමාණයකින් උපරිම නිමවුමක් අත්කර ගත යුතුය.

(2) නිෂ්පාදනයේ කාර්යක්ෂමතාව හා සම්පත් බෙදීයාමේ කාර්යක්ෂමතාව අත්කර ගත යුතුයි.

(3) නිෂ්පාදනයේ කාර්යක්ෂමතාව හා පූර්ණ නිෂ්පාදනය අත්කර ගත යුතුය.

(4) නිෂ්පාදනයේ කාර්යක්ෂමතාවය හා පූර්ණ සේවා නියුක්තිය අත්කර ගත යුතුය.

(5) මානව ප්‍රාග්ධනය හා නිෂ්පාදනයේ ඵලදායිතාව අත්කර ගත යුතුය. (........)

(16) කල්පිත වෙළඳපලක පාන්පිටි මිල එරට රජය විසින් 30% කින් වැඩිකරන ලදී. වෙළඳපලේ මිල වැඩිවීමෙන් පසු නාගරික ජනතාවගේ පිටි පරිභෝජනය 40% කින් ද, වතු ජනතාවගේ පිටි පරිභෝජනය 20% කින්ද අඩු වී ඇති බව වාර්තා විය. මේ අනුව අපට ප්‍රකාශ කළ හැක්කේ,

(1) නාගරික ජනතාවට සාපේක්ෂව වතු ජනතාවගේ පිටි පරිභෝජ්ජනය අඩු වී ඇත.

(2) නාගරික හා වතු ජනතාවට පාන්පිටි අනවශ්‍ය භාණ්ඩයක් වූ බවයි.

(3) නාගරික හා වතු ජනතාවට පාන් පිටි නම්‍ය භාණ්ඩයක් වූ බවයි.

(4) නාගරික ජනතාවට පාන්පිටි අනම්‍ය භාණ්ඩයක් වූ නමුත් වතු ජනතාවට එය නම්‍ය භාණ්ඩයක් වී ඇති බවයි.

(5) නාගරික ජනතාවට පාන් පිටි නම්‍ය භාණ්ඩයක් වූ නමුත් වතු ජනතාවට එය අනම්‍ය භාණ්ඩයක් වී ඇති බවයි. (........)

(17) රජය විසින් පනවන ලද දේශීය භාණ්ඩ බද්දක් සම්පූර්ණයෙන්ම පාරිභෝගිකයාට දැරීමට සිදුවන්නේ,

(1) ඉල්ලුම පූර්ණ අනම්‍ය හා සැපයුම පූර්ණ නම්‍ය වූ අවස්ථාවක

(2) සැපයුම පූර්ණ නම්‍ය වීම හා ඉල්ලුම අනම්‍ය වූ අවස්ථාවක

(3) ඉල්ලුම නම්‍ය වීම හා සැපයුම අනම්‍ය වූ අවස්ථාවක

(4) ඉල්ලුම පූර්ණ නම්‍ය වීම හා සැපයුම පූර්ණ අනම්‍ය වූ අවස්ථාවක

(5) සැපයුම පූර්ණ අනම්‍ය වීම හා ඉල්ලුම ඒකීය නම්‍ය වූ අවස්ථාවක (........)

(18) එක්තරා භාණ්ඩයක ඉල්ලුම සම්බන්ධයෙන් ඉල්ලුම් ශ්‍රිතය $Qd = 120 - 4P$ මෙම භාණ්ඩයේ මිල රු. 20 දී මිල ඉල්ලුම් නම්‍යතාවය වන්නේ,

(1) 0.25 (2) 0.5 (3) 0.4 (4) 2 (5) 2.5 (........)

(19) මිල හා ඉල්ලුම අතර අනුලෝම සම්බන්ධයක් ඇත්තේ කුමන භාණ්ඩයක් සම්බන්ධයෙන්ද?

(1) සාමාන්‍ය භාණ්ඩ (2) අනුපූරක භාණ්ඩ (3) ආදේශන භාණ්ඩ

(4) ගිෆන් භාණ්ඩ (5) බාල භාණ්ඩ (........)

(20) වෙළඳපලේ චොක්ලට් සඳහා වූ සැපයුම් වක්‍රය දකුණට විතැන්වීම සඳහා බලපෑ හැකි සාධකයක් වන්නේ,

(1) චොක්ලට් සඳහා ඇති රුචිය වැඩිවීම.

(2) චොක්ලට් සඳහා ඇති රුචිය අඩු වීම.

(3) පාරිභෝගික ආදායම වැඩි වීම.

(4) චොක්ලට් සඳහා වූ සාධක මිලගණන් ඉහළ යාම.

(5) චොක්ලට් සඳහා වූ සාධක මිල ගණන් පහළ යාම. (........)

(21) පහත සඳහන් වෙළඳපල අතුරෙන් "මිල ගණුවෙකු" ලෙස කටයුතු කරනු ලබන වෙළඳපල වන්නේ,

(1) ඒකාධිකාරී වෙළඳපල (2) පූර්ණ තරගකාරී වෙළඳපල

(3) කතිපයාධිකාරී වෙළඳපල (4) භාණ්ඩ වෙළඳපල

(5) ඒකාධිකාරී තරග වෙළඳපල (........)

(22) පූර්ණ තරගකාරී ආයතනයක 'සැපයුම් වක්‍රය' වන්නේ,

(1) සාමාන්‍ය විචල්‍ය පිරිවැය වක්‍රයේ අවම ලක්‍ෂය ඡේදනය කරමින් ඉහළට ගමන්කරන ආන්තික පිරිවැය වක්‍රයේ ඉහළ කොටසයි.


(2) ආන්තික අයභාර වක්‍රයේ අවම ලක්ෂ්‍ය ඡේදනය කරමින් ඉහළට ඇති ආන්තික පිරිවැය වක්‍රයේ ඉහළ කොටසයි.

(3) සාමාන්‍ය මුළු පිරිවැය වක්‍රයේ අවම ලක්ෂය ඡේදනය කරමින් ඉහළට ගමන් කරන ආන්තික පිරිවැය වක්‍රයේ ඉහළ කොටසයි.

(4) සාමාන්‍ය විචල්‍ය පිරිවැය වක්‍රයේ අවම ලක්‍ෂය ඡේදනය කරමින් ඉහළට ගමන් කරන සාමාන්‍ය මුළු පිරිවැය වක්‍රයේ ඉහළ කොටසයි.

(5) අතිරේක නිමවුමක් නිපදවීමට දරණ පිරිවැයේ එකතුවයි. (........)

(23) කෙටිකාලීන නිෂ්පාදන ක්‍රියාවලියේ යෙදී සිටින පූර්ණ තරගකාරී ආයතනයක X භාණ්ඩයේ පිරිවැය වක්‍රය දැක්වේ. මෙම ආයතනයේ ආර්ථික ලාභය වන්නේ,




(1) රු.මි. 300 (2) රු.මි. 150

(3) රු.මි. 600 (4) රු.මි. 450

(5) රු.මි. 750 (........)

(24) මෙම ආයතනයේ ස්ථාවර පිරිවැය වන්නේ,

(1) රු. 5.00 (2) රු. 10.00

(3) රු. 20.00 (4) රු. 25.00

(5) රු. 30.00 (........)

(25) නිෂ්පාදන න්‍යායට අනුව 'කෙටි කාලය' අර්ථ දක්වා ඇත්තේ,

(1) ස්ථාවර යෙදවුම් වෙනස්කළ නොහැකි කාලයයි.

(2) සියළුම සාධක විචල්‍ය සාධක බවට පත්කළ හැකි කාලයයි.

(3) ස්ථාවර යෙදවුම් වෙනස්කළ හැකි කාලයයි.

(4) විචල්‍ය සාධක වෙනස් කළ නොහැකි කාලයයි.

(5) නිෂ්පාදන ක්‍රියාවලියේදී නිමවුම වැඩිවන කාලයයි. (........)

(26) දිගුකාලීන නිෂ්පාදන ක්‍රියාවලියේ යෙදීසිටින නිෂ්පාදන ආයතනයක් තුළ නිෂ්පාදනයේදී දැකිය හැකි ලක්‍ෂණයකි.

(1) හීනවන ඵලදායීත්වය ක්‍රියාත්මක වීම. (2) පරමාණුකූල ඵල ක්‍රියාත්මක වීම.

(3) ස්ථාවර යෙදවුම්වල කාර්යක්‍ෂමතාවය හීනවීම.

(4) විචල්‍ය යෙදවුම්වල නිමවුම අඩුවීම. (5) ඉහත ලක්ෂණ සියල්ලම. (........)

(27) කෙටිකාලීන නිෂ්පාදන ක්‍රියාවලියේ යෙදීසිටින එක්තරා වෙළඳපලක නිපදවන X භාණ්ඩයේ අලෙවි මිල භාණ්ඩයේ සාමාන්‍ය මුළු පිරිවැයට සමාන විය. මෙයින් පැහැදිලි වන්නේ,

(1) ආර්ථික අලාභ ලබන බවයි. (2) ආර්ථික ලාභ ශූන්‍ය බවයි.

(3) මුළු පිරිවැය භාණ්ඩයේ මුළු අයභාරය ඉක්මවා ඇතිබවයි.

(4) භාණ්ඩයේ මුළු පිරිවැය ආන්තික විචල්‍ය පිරිවැයට සමාන වූ බවයි.

(5) ආර්ථික ලාභ උපරිමය කරා ළඟා වී ඇති බවයි. (........)

(28) නිෂ්පාදන න්‍යායේ 'ඍජු පිරිවැය' ලෙස හඳුන්වනු ලබන්නේ,

(1) යටකළ පිරිවැයයි. (2) ආවස්ථික පිරිවැයයි.

(3) සැලසුම් කරන ලද පිරිවැයයි.

(4) ආයතනය පිටතින් මිලදී ගැනීම් සඳහා වූ මූල්‍ය පිරිවැයයි.

(5) ආයතනයට අහිමි වූ පොළිය සහ වැටුප් වල පිරිවැයයි. (........)

(29) 'සමජාතිය හා ප්‍රභේදනය' වූ භාණ්ඩ දක්නට ලැබෙන වෙළඳපල ව්‍යුහය ලෙස නම් කරනු ලබන්නේ,

(1) ඒකාධිකාරී වෙළඳපල (2) කතිපයාධිකාරී වෙළඳපල

(3) පූර්ණ තරගකාරී වෙළඳපල (4) ඒකාධිකාරී තරග වෙළඳපල

(5) ඉහත සියළුම වෙළඳපලවල්ය. (........)

(30) කෙටිකාලීන නිෂ්පාදන ක්‍රියාවලියේ යෙදී සිටින ආයතනයක් තම නිෂ්පාදනය වහාම නතර කිරීමට හෝ වසා දැමීමට තීරණයක් ගනු ලබන්නේ මින් කවර අවස්ථාවකදී ද?

(1) උපයා ගතහැකි අයභාරය මුළු විචල්‍ය පිරිවැය පියවාගත නොහැකි වූ අවස්ථාවකදී ය.

(2) උපයා ගතහැකි අයභාරය මුළු ස්ථාවර පිරිවැය පියවාගත නොහැකි වූ අවස්ථාවකදි ය.

(3) උපයා ගතහැකි අයභාරය මුළු පිරිවැය පියවාගත නොහැකි වූ අවස්ථාවකදී ය.

(4) ආර්ථික ලාභ උපරිමයට ළඟා වූ ලාභ ලබාගත් පසුවය.

(5) ආර්ථික ලාභ ශූන්‍ය මට්ටමක් අත්කර ගැනීමෙන් පසුවය. (........)

(31) ආවෘත ආර්ථිකයක් තුළට රජය මැදිහත්වීමෙන් පසු ආර්ථිකයේ සමතුලිතය දැක්වෙන නිවැරදි ප්‍රකාශය මින් කුමක්ද?

(1) $Y=C+I+G+x-m$ (2) $Y=C+I$ (3) $S=I$

(4) $y=C+I+G$ (5) $S+T+M=I+G+x$ (........)

(32) ආර්ථිකයක 'විභව නිමවුම' තීරණය වන සාධකයක් වන්නේ මින් කුමක්ද?

(1) ආර්ථිකය සතු සම්පත් සම්භාරය හා තාක්ෂණයේ කාර්යක්ෂමතාව

(2) ආර්ථිකය සතු සම්පත් සම්භාරය හා ජනගහන ප්‍රමාණය

(3) ආර්ථිකය සතු සම්පත් සම්භාරය හා ශ්‍රමබලකායේ ප්‍රමාණය

(4) ආර්ථිකය සතු සම්පත් සම්භාරය හා ඊට සාපේක්ෂ වුවමනා ප්‍රමාණය

(5) ආර්ථිකය සතු සම්පත් සම්භාරය හා සම්පත් බෙදීයාමේ කාර්යක්ෂමාතාවය (........)

(33) කල්පිත ආර්ථිකයක ඉතුරුම් රු.මි. 2000 ක්, බදු රු.මි. 2400 ක්, ආනයන රු.මි. 1000 ක්, අපනයන රු.මි. 800 හා ආයෝජන රු.මි. 1600 ක් වූයේ නම් රජයේ මිල දී ගැනීම් කොපමණද?

(1) රු.මි. 1600 (2) රු.මි. 1500 (3) රු.මි. 3000

(4) රු.මි. 2000 (5) රු.මි. 3600 (........)

(34) පවත්නා මිල අනුව ගණනය කරන ලද දළ ජාතික නිෂ්පාදිතය රු.මි. 30,000 ක්ද, මුදල් සැපයුම රු.මි. 20,000 ක් ද පැවතියේ නම් අදාළ වර්ෂයේ මුදල් සංසරණ ප්‍රවේගයේ අගය,

(1) 3 (2) 0.3 (3) 300 (4) 0.33 (5) 33 (........)

(35) 'ව්‍යාපාර චක්‍ර' හි මුදුනත්, පතුලත් අතර කාලය මගින් පැහැදිලි වන්නේ එම ආර්ථිකයේ,

(1) පසුබැසීම හෙවත් ප්‍රතිගමනයයි. (2) පසුබැසීම හෙවත් ප්‍රසාරණයයි.
(3) සේවා නියුක්තියේ ඉහළ යාමයි. (4) මූර්ත නිෂ්පාදනයේ වර්ධනයයි.
(5) පසුබැසීම හා නිෂ්පාදනයේ ඉහළයාමයි. (........)

(36) ආර්ථික වෘද්ධිය ලෙස ආර්ථික විද්‍යාඥයින් අර්ථ දක්වා ඇත්තේ,

(1) දළ දේශීය නිෂ්පාදිතයේ වාර්ෂික වර්ධනය
(2) මුදල් ජාතික ආදයමේ ඉහළ යාමයි.
(3) මූර්ත දළ ජාතික නිෂ්පාදිතයේ අඛණ්ඩ වර්ධනයයි.
(4) පවත්නා වර්ෂයට සාපේක්ෂ සලකා බලන වර්ෂයේ නිෂ්පාදිතයේ වැඩිවීමයි.
(5) නාමික දළ දේශීය නිෂ්පාදනය ප්‍රතිශතාත්මකව වැඩිවීමයි. (........)

(37) ශුද්ධ ජාතික ආදායම නිවැරදිව දක්වා ඇත්තේ කුමන ප්‍රකාශය මගින්ද?

(1) ශුද්ධ දේශීය ආදායම + විදේශ ශුද්ධ සාධන ආදායම
(2) ශුද්ධ දේශීය ආදායම + ක්ෂය වීම් (3) ශුද්ධ දේශීය ආදායම - ක්ෂය වීම්
(4) ශුද්ධ දේශීය ආදායම - ශුද්ධ වක්‍ර බදු (5) ශුද්ධ දේශීය ආදායම + වක්‍ර බදු (........)

(38) සාර්ව ආර්ථිකයක ඉතුරුම් ශ්‍රිතය $S = -300 + 0.25\,Y$ හා වැයකළ හැකි ආදායම රු. 500 නම් ස්වාධීන පරිභෝජනය වන්නේ මින් කවර අගයද? (රු.මි.)

(1) - 300 (2) 300 (3) 675 (4) 125 (5) 425 (........)

(39) කිසියම් ආර්ථිකයක නිෂ්පාදනයක් සම්බන්ධයෙන් කල්පිත දත්ත සමූහයක් ඔබට සපයා ඇත. රෙදිපිළි වටිනාකම රු.මි. 20,000 ද, නිෂ්පාදන ක්‍රියාවලියට පිටතින් මිලදී ගත් නූල් සඳහා රු.මි. 2500 ක්ද, සායම් වර්ග රු.මි. 1,000 ද, විවිධ ද්‍රව්‍ය සඳහා රු.මි. 500 ද, ශ්‍රමයට වැටුප් රු.මි. 2500 ද නම් රෙදිපිළි නිෂ්පාදනයේ නිමවුම් වටිනාකම වන්නේ,

(1) රු.මි. 6000 (2) රු.මි. 13500 (3) රු.මි. 16000
(4) රු.මි. 26500 (5) රු.මි. 6500 (........)

(40) සාර්ව ආර්ථිකයක පරිභෝජන ශ්‍රිතය $C = 200 + 0.8\,yd$ නම් මෙහි බදු ගුණකය වන්නේ,

(1) -4 (2) 4 (3) ග66 (4) 2/3 (5) 0.4 (........)

(41) 'ප්‍රාථමික මිල ගණන්' මැනීම සඳහා ශ්‍රී ලංකාවේ යොදාගනු ලබන මිල දර්ශකයකි.

(1) ගම්‍ය මිල දර්ශකය (2) නව කොළඹ පාරිභෝගික මිල දර්ශකය
(3) තොග මිල දර්ශකය (4) සිල්ලර මිල දර්ශකය
(5) මහ කොළඹ (නාගරික) මිල දර්ශකය (........)

(42) 'නිරුද්ධවනය' යනුවෙන් හැඳින්වෙන්නේ පහත කරුණු අතරින් කුමන ප්‍රකාශය මගින්ද?

(1) උද්ධමන අනුපාතයේ පමාණය ක්‍රමයෙන් අඩුවීමයි.
(2) පොදු මිල මට්ටමේ අඛණ්ඩ පහළ වැටීමයි.
(3) පොදු මිල මට්ටමේ අඛණ්ඩ ඉහළ යාමයි.
(4) නව කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ අඩු වීමයි.
(5) සියළුම මිල දර්ශකවල අඛණ්ඩ පහළ යාමයි. (........)

The National e-learning Portal for The General Education

(43) එක්තරා ආර්ථිකයක උද්ධමන අනුපාතය 18% වූ අතර නාමික පොලී අනුපාතය 16% වූයේ නම් මූර්ත පොලී අනුපාතය වන්නේ,

(1) -4 (2) -2 (3) 0.02 (4) 2 (5) 4 (........)

(44) ද්‍රවශීලතා වරණය නිවැරදිව අර්ථ දක්වා ඇත්තේ මින් කුමන ප්‍රකාශය මගින්ද?

(1) උද්ධමන අනුපාතය සහ පොලී අනුපාතය අතර වෙනසයි.
(2) පොලී අනුපාතය අඩුවන විට මුදලට කරන ඉල්ලුම වැඩිවීමයි.
(3) ආදායම හා මුදලට ඇති ඉල්ලුම අතර සම්බන්ධතාවයයි.
(4) මූර්ත වත්කම් ප්‍රාග්ධන අලාභයකින් තොරව මුදල් බවට පරිවර්තනය කර ගැනීමේ හැකියාවයි.
(5) මුදල් වශයෙන් ළඟ තබාගැනීමට මුදලට කරන ඉල්ලුමයි. (........)

(45) 2000 වර්ෂයේදී A ගෙන් ලබාගත් රු. 1000 මුදල මෙම වර්ෂයේ මුලදීම ඔහුට ගෙවා නිදහස් වූ බව මගේ මිතුරා පවසන ලදී. මෙම ක්‍රියාව තුළින් මුදලේ කුමන කාර්ය ඉටුවී තිබේද?

(1) හුවමාරු කිරීමේ මාධ්‍ය (2) පොදු පිළිගැනීම (3) විලම්භිත ගෙවුම් ක්‍රමය
(4) වටිනාකම සන්නිධියක් (5) ගිණුම් ඒකකයක් (........)

(46) ආර්ථිකය තුළ කවර කරුණක් පිරිවැයෙන් තල්ලු වූ උද්ධමනයට හේතු සාධක විය හැකිද?

(1) ආනයන කරන ලද ඛණිජ තෙල් මිල ඉහළ යාම.
(2) මහ බැංකු විවෘත වෙළඳපලේ සුරැකුම්පත් මිලට ගැනීම.
(3) රජයේ සේවකයින්ගේ වැටුප් කප්පාදු කිරීම.
(4) රටේ මුදල් සැපයුම වැඩි වීම.
(5) වාණිජ බැංකුවල ද්‍රවශීලතා සංචිත පහළ දැමීම. (........)

(47) වාණිජ බංකුවල ඇති වත්තකම් වල ප්‍රාථමික වත්කම් ලෙස හඳුන්වන්නේ,

(1) සුරැකුම්පත් (2) කාසි හා නෝට්ටු (3) ආයෝජන වත්කම්
(4) භාණ්ඩාගාර බිල්පත් (5) ඉපයූ වත්කම් (........)

(48) මුදලට ඇති ඉල්ලුම තීරණය වන්නේ,

(1) පොළිය හා ආදායම මතය (2) ආදායම හා විදයම මතය
(3) පොළිය හා වියදම මතය (4) අවශ්‍යතා හා ආදායම මතය
(5) පොළිය හා සංචිතය මතය (........)

(49) ආර්ථිකය තුළ මුදල් සැපයුම ප්‍රසාරණය කිරීමට මහ බැංකුව යොදාගනු ලබන ක්‍රමවේදය වන්නේ,

(1) වාණිජ බැංකුවල ණයදීම පහළ හෙලීම. (2) විවිධ වෙළඳපලේ සුරැකුම්පත් විකිණීම.
(3) මුල්‍ය ආයතනවල ණය දීම වැඩි කිරීම. (4) ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ඉහළ දැමීම.
(5) ප්‍රතිපත්ති පොළී අනුපාතය අඩුකිරීම. (........)

(50) ශ්‍රී ලංකා මහ බැංකුව වාණිජ බැංකු සමග ප්‍රති ගැණුම් ගිවිසුම් ඇති කර ගත්විට,

(1) මුදල් සැපයුම ඉහළ යයි.
(2) වාණිජ බැංකුවල සංචිත වැඩිවේ.
(3) මහ බැංකුවේ ව්‍යවස්ථාපිත සංචිතය ඉහළ යයි.
(4) ක්ෂණික ණය වෙළඳපලේ නිත්‍ය ණය පහසුකම් අනුපාතය තීරණය වේ.
(5) වාණිජ බැංකුවල අතිරික්ත සංචිත අඩු වේ. (........)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved.



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# ආර්ථික විද්‍යාව - II

12 ශ්‍රේණිය

කාලය පැය 03 යි.

- එක් කොටසකින් ප්‍රශ්න දෙකක්වත් තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

---

## 'අ' කොටස

01. (1) නොදියුණු හා දියුණු සමාජයක පවා හිඟකම මූලික ආර්ථික ප්‍රශ්නයක් බවට පත් වී ඇත. ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

(2) 'හිඟකම' ප්‍රශ්නය තුළ තේරීමක් කිරීමට සිදු වී ඇත්තේ කවර සාධක නිසාද? මූලික තේරීම් ප්‍රශ්න කවරේද?

(3) ආර්ථික සම්පත් යන්න පැහැදිලි කරන්න.

(4) සමහර අවස්ථාවලදී ස්වභාවික භාණ්ඩ පවා ආර්ථික භාණ්ඩ වන අවස්ථා දැකිය හැකිය. මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න.

(5) නිෂ්පාදන සම්පත් තුළ ප්‍රතිස්ථාපනය කළ නොහැකි සම්පත් ලෙස ඔබ හඳුනාගනු ලබන්නේ කෙසේද? උදාහරණ 2 සපයන්න. (ල. $4 \times 5 = 20$)

02. (1) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් යන්න නිර්වචනය කර ආර්ථික සාධක මට්ටම් ඇගැයීමේලා නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර යොදාගත හැකි අවස්ථා නම් කරන්න. (ල. 05)

(2) මූලයට අවතල හැඩයක් ගන්නා නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය පැහැදිලි කර නිෂ්පාදන ක්‍රියාවලියේදී එවැනි තත්ත්වයක් හටගැනීමට හේතු වූ කරුණු නම් කරන්න. (ල. 05)

(3) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් ඇඳ පහත සිදුවීම් ඒ මත ලකුණු කර දක්වන්න. (ල. $2 \times 5 = 10$)

(i) පූර්ණ සේවා නියුක්ති මට්ටම

(ii) සම්පත් හිඟකම

(iii) ආවස්ථිත පිරිවැය සහිත නිෂ්පාදන මට්ටම

(iv) ආවස්ථිත පිරිවැය ශුන්‍ය වන අවස්ථාව

(v) ආර්ථික සම්බාධක පැනවීමෙන් පසු ආර්ථිකයේ නිෂ්පාදන මට්ටම පහළ යාම.

03. (1) ආර්ථික පද්ධතියක් විවිධත්වයකින් යුක්ත වේ. විවිධත්වයක් කෙරේ බලපාන නිර්නායක කවරේද? (ල. 03)

(2) වර්ගකරනු ලබන විකල්ප ආර්ථික පද්ධති කවරේද? (ල. 03)

(3) වෙළඳපල ආර්ථිකයක් භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීමේලා වෙළඳපල යාන්ත්‍රණය ප්‍රශස්ථ මට්ටමක පවතීද? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ල. 04)

(4) නූතන ආර්ථික විද්‍යාවට අනුව අසීමාන්තික නිෂ්පාදන සාධක නම් කරන්න. (ල. 04)

(5) මුදල් හා ප්‍රාග්ධනය අතර පවතින වෙනස්කම් දක්වන්න. (ල. 04)

04. මහවැලි සී කලාපයේ වී ගොවීන් සමස්ථ සැපයුමෙන් කුඩා කොටස්කරුවෝ වෙති.

(1) මහවැලි ගොවීන් කුමන වෙළඳපල ව්‍යුහයකට අයත්වේද? (ල. 02)

(2) එමවෙළඳපලේ දක්නට ඇති ලක්ෂණ 3 ක් ලියන්න. (ල. 04)

(3) පූර්ණ තරගකාරී වෙළඳපලක ඉල්ලුම් වක්‍රය පූර්ණ නම්‍යවූවකි. මෙවැනි වෙළඳපලක පූර්ණ නම්‍ය ඉල්ලුම් ඉල්ලුම් වක්‍රයක් දක්නට ලැබෙන හේතු සාධක පැහැදිලි කරන්න. (ල. 04)

(4) පූර්ණ තරගකාරී වෙළඳපල 'සැපයුම් වක්‍රය' පැහැදිලි කරන්න. (ල. 05)

(5) ආර්ථික ලාභ හා ගණකාධිකරණ ලාභ අතර වෙනසක් පවතීද? පැහැදිලි කරන්න. (ල. 05)

05. (1) ඉල්ලුම් වක්‍රයක් වමේ සිට දකුණට බෑවුම් වන්නේ ඇයි? ඉල්ලුම් ප්‍රමාණයේ හා ඉල්ලුමේ වෙනස අතර පවත්නා වෙනස දක්වන්න. (ල. 03)

(2) ඉල්ලුමේ මිල නම්‍යතාවය තීරණය වන සාධක නම් කරන්න. (ල. 03)

(3) වී සඳහා වෙළඳපල ඉල්ලුම් හා සැපයුම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

$Qd = 70 - 4P \quad Qs = 30 + 4P$

(අ) වී සඳහා වෙළඳපල සමතුලිත මිල හා ප්‍රමාණය සමීකරණය මගින් ගණනය කරන්න. (ල. 04)

(ආ) රජය රු. 8.00 ක සහතික මිලක් ගොවීන්ට ලබාදීමට තීරණය කරනු ලැබුවහොත් වෙළඳපලට සපයන වී ප්‍රමාණය කොපමණද? එම මිල යටතේ ඇති සැපයුම කොපමණද? (ල. 04)

(ඉ) සහතික මිලෙන් පසු මුලු වී සැපයුම වෙළඳපලට පැමිණීමෙන් පසු වෙළඳපල මිල කොපමණද? (ල. 02)

(ඊ) රජය සහතික මිල යටතේ වී මිලදී ගැනීමට තීරණය කරනු ලැබුවේ නම් වී මිලදී ගැනීමට රජයට දැරීමට සිදුවන වියදම කොපමණද? (ල. 02)

(උ) සහතික මිල පැනවීමෙන් පසු රජයට වී සඳහා ප්‍රතිපූර්ණය කළ යුතු මුදල කොපමණද? (ඌණපූරණය) (ල. 02)

The National e-learning Portal for The General Education

'ආ' කොටස

06. (1) ආර්ථිකයක් තුළ හටගනු ලබන "ආර්ථික අවපාතය හා පරිහානිය පැහැදිලි කරන්න. (ල. 04)

(2) ආර්ථිකයක් තුළ දළ දේශීය නිෂ්පාදනය ගණනය කිරීමේදී බහු ගණන දෝශ හා ද්වි ගණන දෝශ වැළැක්වීම සඳහා යොදාගත හැකි විකල්ප ක්‍රම කවරේද? (ල. 02)

(3) සරල ආර්ථිකයක ජාතික ආදායමේ සමතුලිතය ලියා දක්වන්න. (ල. 02)

(4) එක්තරා කල්පිත ආර්ථිකයක සාර්ව ආර්ථික දත්ත පෙළක් පහත දැක්වේ. එම තොරතුරු ආශ්‍රයෙන් පිළිතුරු සපයන්න.

| | | |
|---|---|---|
| රාජ්‍ය අයවැය ශේෂය | රු.මි. | - 250 |
| පරිභෝජන වියදම | රු.මි. | 4,200 |
| ජාතික ආදායම | රු.මි. | 6,200 |
| රජයේ වියදම | රු.මි. | 700 |
| ආනයන වියදම | රු.මි. | 860 |
| අපනයන ඉපයුම් | රු.මි. | 240 |

(අ) රාජ්‍ය බදු ආදායම ගණනය කරන්න. (ල. 04)

(ආ) වැඩිකළ හැකි ආදායම කොපමණද? (ල. 04)

(ඉ) ආයෝජනවල වටිනාකම අගයන්න. (ල. 04)

07. (1) ජාතික ආදායම ගණනය කිරීමේදී සංක්‍රාම ගනුදෙනු ඇතුලත් කරනු නොලැබේ. පැහැදිලි කරන්න. (ල. 03)

(2) ඕනෑම ආර්ථිකයකට ජාතික ආදායම් ඇස්තමේන්තු එම ආර්ථිකයේ වැදගත් ඇගැයීම් සාධකයකි. මෙම ප්‍රකාශනය පැහැදිලි කරන්න. (ල. 05)

(3) සමහර වියදම් ඇතුලත් සංරචක කවරේද? (ල. 02)

(4) සරල ආර්ථිකයක පරිභෝජන ශ්‍රිතය $c = 300 + 0.75\,Y$ වේ.

(අ) ඉතුරුම් සමීකරණය ගොඩනගන්න. (ල. 02)

(ආ) ආදායම රු. 2000 දී ඉතුරුම් මට්ටම ගණනය කරන්න. (ල. 04)

(ඉ) ඉතුරුම් ශුන්‍ය වන ආදායම් මට්ටම කුමක්ද? (ල. 04)

08. (1) පුද්ගලයින් මුදල් ඉල්ලුම් කරනු ලබන්නේ ඇයි? මුදලට ඇති ඉල්ලුම කෙරේ බලපෑමක් සිදුකරනු ලබන සාධක කවරේද? (ල. 04)

(2) අධිබලැති මුදල් හෙවත් පදනම් මුදල්වල ආර්ථිකමය වැදගත්කමක් පවතීද? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ල. 04)

(3) වාණිජ බැංකුවක මුදල් මැවීමේ ක්‍රියාවලිය සිදුවීම සඳහා බැංකු පද්ධතියක් තුළ තිබිය යුතු මූලික ලක්ෂණ නම් කරන්න. (ල. 04)

(4) මුදල් සැපයුම අර්ථ දක්වා පුළුල් මුදල් සැපයුමේ අන්තර්ගතය දක්වන්න. (ල. 04)

(5) ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අරමුණු කවරේද? (ල. 04)

09. (1) හුවමාරු කිරීමේ අතරමැදි ඒකකයක් ලෙස මුදලේ කාර්යයන් කවරේද? (ල. 04)

(2) මහ බැංකුව රටේ මිල ස්ථායිතාවය හා මූල්‍ය පද්ධතියේ ස්ථායිතාවය ආරක්ෂා කිරීමට ක්‍රියාත්මක කරනු ලබන ප්‍රතිපත්තිය කවරේද? ඒ සඳහා යොදාගනු ලබන උපකරණ මොනවාද? (ල. 05)

(3) කල්පිත ආර්ථිකයක වාණිජ බැංකුවක ශේෂ පත්‍රය දැක්වේ. ඒ ආශ්‍රයෙන් පිළිතුරු සපයන්න.

ශේෂ පත්‍රය

| | | | |
|---|---|---|---|
| ඉල්ලුම් තැන්පතු | 25000 | කාසි සංචිතය | 5500 |
| | | ණය | 19500 |
| | 25000 | | 25000 |

(අ) ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 10% වූයේ නම් බැංකුව සතුව ඇති අධි සංචිත ප්‍රමාණය කොපමණද? (ල. 02)

(ආ) අධි සංචිත පවතින්නේ නම් සැපයිය හැකි ණය ප්‍රමාණය කොපමණද? (ල. 03)

(ඉ) ණය මැවිය හැකි ප්‍රසාරණ සංගුණකය කොපමණද? (ල. 03)

(ඊ) බැංකුවට අධි සංචිත ආශ්‍රයෙන් ආර්ථිකයේ මුදල් සැපයුමට එකතුකළ හැකි මුළු ඉල්ලුම් තැන්පතු ප්‍රමාණය කොපමණද? (ල. 03)